සියලුම හිමිකම් ඇවිරිණි
(ලාංඡා පසිඳුරිකාවෘකයා)
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	10	විෂයය பாடம் Subject	පෙරදිග සංගීතය	පත්‍රය வினாத்தாள் Paper	I	කාලය காலம் Time	පැය 01

නම/විභාග අංකය:-.....

I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

---

(01) "ම ග / ම රි / ග ම / ප ග / ම රි / ස -/" ස්වර පාදය සඳහා වඩාත්ම ගැළපෙන ප්‍රකාශය වන්නේ,
i. බිලාවල් රාගය ආශ්‍රිත සර්ගම් ගී පාදයකි.
ii. කල්‍යාණ මේල ගත භූපාලි ස්වර ස්ථාපන ගී පාදයකි.
iii. බිලාවල් මේල ගත ස්වර විස්තාරයකි.
iv. භූපාලි රාගය ආශ්‍රිත සර්ගම් ගී පාදයකි.

(02) "නි ස ගු ම ප , ගු ම ගු රි ස" ස්වර සංගතයි යෙදෙන රාගය නම් කරන්න.
i. කාෆි රාගය.
ii. හෙරවී රාගය.
iii. යමන් රාගය.
iv. භූපාලි රාගය.

(03) ඉහත රාගයේ (ප්‍රශ්න අංක 2) යෙදෙන "මධ්‍යමය" ස්වරය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
i. මධ්‍යමය තීව්‍රව යෙදේ.
ii. මධ්‍යමය වර්ජිත ස්වරයකි.
iii..මධ්‍යමය ශුද්ධව යෙදේ.
iv. මධ්‍යමය සංවාදී ස්වරයයි.

(04) "ග ස්වර වාදී ගි සංවාදී"ලෙස හැඳින්වෙන රාගය කුමක්ද?
i. බිලාවල් රාගය.
ii. භූපාලි රාගය.
iii. හෙරවී රාගය.
iv. යමන් රාගය.

(05) "දිවා ප්‍රථම ප්‍රහරය" ගායන සමය වන රාග යුගලය තෝරන්න.
i. යමන් - භූපාලි.
ii. බිලාවල් - හෙරවී.
iii. හෙරවී - කාෆි.
iv. යමන් - කාෆි.

(06) "රාත්‍රී ප්‍රථම ප්‍රහරය" ගායන සමය වන නිර්දේශිත රාග යුගලයේ සමාන ලක්ෂණය කුමක්ද?
i. ගාන්ධාරය වාදී ස්වරය වේ.
ii. බිලාවල් මේල ගත වේ.
iii. ජාතිය සම්පූර්ණ වේ.
iv. සියලු ස්වර ශුද්ධ වේ.

CamScanner

Past Papers Wiki

- පහත වගුව ඇසුරින් අංක 7 සිට 10 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A	B	C
ජසයා ලෙන්චිනා නොංචි අක්කා	ඉයුජින් බැලසන්ත බ්‍රම්පෝඩ්	ශ්‍රී වික්‍රම පද්මාවතී දුටුගැමුණු

(07) ඉහත වගුවේ A,B,C තීරුවල ඇතුළත් කරුණු වලට අදාළ රංග සම්ප්‍රදායන් මොනවාද?

i. නාඩගම් - කෝලම් - නූර්ති
ii. කෝලම් - නාඩගම් - නූර්ති
iii. නාඩගම් - නූර්ති - කෝලම්
iv. කෝලම් - නූර්ති - නාඩගම්

(08) උතුරු ඉන්දියානු හින්දුස්ථානි සංගීතයේ ආභාසය ලද නාට්‍ය ඇතුළත් අක්ෂරය කුමක්ද?

i. A
ii. B
iii. C
iv. BC

(09) "B" තීරුවට අයත් නොවන සංගීතාංගය තෝරන්න.

i. දොහොරාව.
ii. උරුට්ටුව.
iii. තෝඩායම.
iv. ඉන්නිසය.

(10) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ගුරින් විසින් නව නාට්‍ය සඳහා තනු ආභාසය කර ගත් ගී තනු ඇතුළත්ව ඇති අක්ෂරය තෝරන්න.

i. A
ii. B
iii. C
iv. ඉහත කිසිවක් නොවේ.

- පහත රූපසටහන් ඇසුරින් අංක 11 සිට 14 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



(A)



(B)



(C)



(D)

(11) "ගසල් ගායනයේ රජු" යන නාමයෙන් හඳුන්වන සංගීතඥයා ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න.

i. A
ii. B
iii. C
iv. D

(12) තබ්ලාව නම් "අවනද්ධ වාද්‍ය" භාණ්ඩය ලොව පුරා ප්‍රචලිත කිරීම සඳහා දායක වූ සංගීතඥයෙකි.

i. පණ්ඩිත් රවි ශංකර්
ii. ජග් ජීත් සිං
iii. උස්තාද් ශකීර් හුසේන්
iv. පණ්ඩිත් හරි ප්‍රසාද් චෞරසියා.

(13) "මදර් ඉන්ඩියා, පාතර් පංචාලි" වැනි චිත්‍රපට වල සංගීත නිර්මාණය කළ ප්‍රසිද්ධ සංගීතඥයෙකි.

i. උස්තාද් ශකීර් හුසේන්
ii. ජග් ජීත් සිං
iii. උස්තාද් හරි ප්‍රසාද් චෞරසියා
iv. පණ්ඩිත් රවි ශංකර්

CamScanner

(14) "පණ්ඩිත් හරි ප්‍රසාද් චෞරසියා" ප්‍රසිද්ධත්වය උසුලන වාද්‍ය භාණ්ඩය පිළිබඳ නිවැරදි පිළිතුර තෝරන්න.

i. කායදා, පල්ටා, රේලා වාදන අංග සහිතයි.
ii. ගුෂිර වාද්‍ය භාණ්ඩ ගණයට අයත් වේ.
iii. පර්දා සහිත තත් වාද්‍ය භාණ්ඩයකි.
iv. ස්වර පුවරු සහිත ගුෂිර වාද්‍ය භාණ්ඩයකි.

(15) සර්ගම් ගීත ප්‍රබන්ධ පිළිබඳ ආදාළ නොවන කරුණ තෝරන්න.

i. රාගයට අදාළ ස්වර පමනක් යොදා ගනී.
ii. තාලයකට අනුගත වන සේ නිර්මාණය වී ඇත.
iii. රාගයේ ස්වර චලනය විදහා දක්වයි.
iv. රාගයේ විස්තර ඇතුළත් වේ.

(16) "තූ ගංගා කී මෝජු මේ, මෙරේ මන් කී ගංගා" ආදී හින්දි චිත්‍රපට ගීත නිර්මාණය සඳහා යොදා ගන්නා ලද රාගය කුමක්ද?

i. හෙරවී රාගය.
ii. බමාජ් රාගය
iii. යමන් රාගය
iv. හමීර් රාගය

- අංක 17 සිට 20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ගී පද උපයෝගී කරගන්න.

A. සදවා සුදු වැලි පිවිතුරු –
B. ආරණ්‍යයේ ඉන්නා මේ රම්‍යා කතේ –
C. සාර සදිසි පෙති පේර නෙලන කළ –
D. දුල් නිමල් සිසි සේදිසි සරදඹරේ –
E. දබරේ කරකවා අත් දෙක කකියනවා –
F. පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට –

(17) සේ ගී ගණයට අයත් ගී පාද ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න.

i. AB
ii. DE
iii. AF
iv. BD

(18) ආඝාතාත්මක සහ අනාඝාතාත්මක ගැමි ගී ගණයට අයත් වන ගී පාද ඇතුළත් ඉංග්‍රීසි අක්ෂර මොනවාද?

i. EF
ii. AB
iii. CE
iv. FC

(19) දේශීය රංග සම්පදායන් දෙකකට අයත් ගී පාදයන් දැක්වෙන ඉංග්‍රීසි අක්ෂර යුගලය තෝරන්න.

I. AB
ii. BC
iii. CD
iv. BD

(20) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත කාව්‍යයේ එන ගී පාදය ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,

i. F
ii. D
iii. B
iv. A

(21) නෙළුම් ගී තනු පාදක කර ගනිමින් නිර්මාණය කරන ලද "දැතට වළලු...." ගීතය නිර්මාණය කළ සංගීතඥයා වන්නේ,


i. රෝහණ බැද්දගේ මහතා.
ii. සී. ද එස්. කුලතිලක මහතා.
iii. ඩබ්ලිව්. බී. මකුලොළුව මහතා.
iv. ලයනල් රන්වල මහතා.


(22) දේශීය නාඩගම් ගී තනු ශෛලියට අනුගතව නිෂ්පාදනය වූ නව නාට්‍යකට අයත් ගී පාදය තෝරන්න.

i. සේ සුරිඳු බරණැස් පුර පසිඳු .
ii. සත් සියක් කපුමල්
iii. ඇදුරුතුමා වන්න මගේ.
iv. මුහුදු පතුල යට ඉඳලා.

PAST PAPERS WIKI
CamScanner

- අංක 23 සිට 26 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් රූපසටහන් උපයෝගී කරගන්න.


(A)


(B)


(C)


(D)

(23) "ගම්හිර කාලිංග නුවර" ගී පාදය සඳහා වාදනයට සුදුසු භාණ්ඩය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක්ද?
i. A ii. B iii. C iv. D

(24) "ජෙං ගත් ජෙං ගත් ජෙං ජෙං තා" යන බෙර පදය වාදනයට සුදුසු භාණ්ඩය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය කුමක්ද?
i. A ii. B iii. C iv. D

(25) "විතත" ගණයට අයත් භාණ්ඩය ඇතුළත් ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න.
i. A ii. B iii. C iv. D

(26) A අක්ෂරයෙන් දැක්වෙන භාණ්ඩය සඳහා වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරන්න.
i. අවමංගල අවස්ථාවලදී වාදනය කෙරේ.
ii. අණ බෙරය ලෙස යොදා ගන්නා ලදී.
iii. උඩරට නර්තනයේදී භාවිතා වේ.
iv. හේවිසි වාදනයේදී යොදා ගනී.

(27) සංගීත භාණ්ඩ වල හඬ එකිනෙකට වෙන් කොට හඳුනා ගැනීමේ ගුණය හඳුන්වන නම කුමක්ද?
i. තාරතාවය ii. විපුලතාවය iii. රූප භේදය iv. ධ්වනි ගුණය

(28) කවියක් ගීතයක් ලෙස යොදා ගත් අවස්ථාවක් ලෙස ගත හැකි ගී පාදය තෝරන්න
i. රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දීදී
ii. ගමට කළින් හිරු මුළුතැන් ගෙට වඩනා
iii. සෙන්පතියන් ගැන නැව් පතියන් ගැන
iv. අන්දර යායේ වැව් තාවුල්ලේ

(29) විද්‍යුත් යතුරු පුවරු සංගීත භාණ්ඩ මගින් කරනු ලබන නිර්මාණ හඳුන්වන නම කුමක්ද?
i. E Learning ii. MIDI iii. E Music iv. Electronic Sound

(30) පහත ගී පද සංගීතවත් කොට නිර්මාණය කරන ලද සංගීත ශිල්පීන් පිළිවෙලින් නම් කර ඇති පිළිතුර කුමක්ද?

A	B	C	D
මල්සරා බැල්ම හෙලා	වන්නම් සවුදම් ගායන සූරිය මංගල	බැද්ද වටට සුදු මොර මල් පිපිලා	තෙල්ගාලා හිස පීරන් නෑනෝ

i. රෝහණ බැද්දගේ මහතා, ඩබ්. බී. මකුලොළුව මහතා, සමන් ලෙනින් මහතා, ලයනල් රන්වල මහතා
ii. ලයනල් රන්වල මහතා, රෝහණ බැද්දගේ මහතා, ඩබ්. බී. මකුලොළුව මහතා, සමන් ලෙනින් මහතා
iii. රෝහණ බැද්දගේ මහතා, ඩබ්. බී. මකුලොළුව මහතා, සුනිල් ශාන්ත මහතා, ලයනල් රන්වල මහතා
iv. රෝහණ බැද්දගේ මහතා, ලයනල් රන්වල මහතා, සී. ද එස්. කුලතිලක මහතා, සුනිල් ශාන්ත මහතා

CamScanner

(31) පහත A,B,C,D අක්ෂරයන්ට අයත් වන තාල නාමයන් පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.

A	B	C	D
ධි ධි න	ධා තිං තිං තා	ධා ධි න	තා තිං -

i. දාදරා තාලය, කෙහෙර්වා තාලය, ජප් තාලය, ත්‍රී තාලය

ii. ජප් තාලය, ත්‍රී තාලය, දාදරා තාලය, දීප්චන්දි තාලය

iii. දාදරා තාලය, දීප්චන්දි තාලය, ජප් තාලය, කෙම්ටෝ තාලය

iv. ජප් තාලය, ත්‍රී තාලය, දාදරා තාලය, දීප්චන්දි තාලය

(32) නාද තරංගයක් පිළිබඳ කියැවෙන නිවැරදි පිළිතුර තෝරන්න

i. නාද තරංගයක හඬ ගෝෂාකාරී වේ.

ii. විෂමාකාරී කම්පන වලින් යුක්ත වේ.

iii. නැවත නැවත ඒ ආකාරයෙන්ම ඇති කළ හැකිය.

iv. නිශ්චිත සංඛ්‍යාතයක් නොමැත.

- අංක 33 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත ජන ගී පාද උපයෝගී කරගන්න.

A. රෑ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දීදී විදුලිය පබා
B. සඳවා සුදු වැලි පිවිතුරු
C. මන් මත් කරවන දන මුළු දෙරණා

(33) ඉහත දක්වා ඇත්තේ,

i. සැලළිහිණි සංදේශයේ එන ගී පාද වේ.

ii. ගුත්තිල කාව්‍යයේ එන ගී පාද වේ.

iii. පැරකුම්බා සිරිතේ එන ගී පාද වේ.

iv. ගැමි ගී පාද වේ.

(34) "C" හි දැක්වෙන ගී පදය ගායනයට උචිත දේශීය තිත කුමක්ද?

i. මහ තනි තිත

ii. සුළු මැදුම් දෙතිත

iii. සුළු මහ දෙතිත

iv. මැදුම් තනි තිත

(35) "A" හි දැක්වෙන ගී පදයේ ඇතුළත් ගී මත් සහ සඳැස් මත් ගණන කීයද?

i. 28 - 08

ii. 26 - 27


iii. 28 - 26

iv. 26 - 08

CamScanner

Past Papers Wiki

- පහත අපරදිග ස්වර ප්‍රස්තාරය ඇසුරින් පිළිතුරු සපයන්න.



(36) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය සඳහා සුදුසු time signature තෝරන්න.
i. 4/4 ii. 3/4 iii. 6/8 iv. 5/4

(37) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය නිර්මාණය වී ඇති ස්කේලය (Scale) කුමක්ද?
i. C major Scale. ii. F Major Scale
iii. G Major Scale iv. Bb Major Scale

(38) ඉහත ස්වර ප්‍රස්තාරයේ අංක 1,2,3,4 මගින් දක්වා ඇති අපරදිග ස්වර සංකේත නිවැරදිව නම් කර ඇති පිළිතුර තෝරන්න.
i. Crotchet, minim, tie or bind, doted minim
ii. Quaver, crotchet, bar line, minim
iii. Crotchet, Semibreve, bar line, minim
iv. Quaver, semibreve, tie or bind, doted minim

(39) හෙළ බස යොදා ගනිමින් මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී සඳහා දායක වූ සංගීතඥයින් ඇතුළත් වරණය තොරන්න.
i. ග්‍රේටා ජෙනට් මහත්මිය, එච්. ඩබ්. රූපසිංහ මහතා
ii. ආනන්ද සමරකෝන් මහතා, සුනිල් ශාන්ත මහතා
iii. නන්දා මාලනී මහත්මිය, සී. ටී. ප්‍රනාන්දු මහතා
iv. සී. දොන් බස්තියන් මහතා, චාල්ස් ඩයස් මහතා

(40) "රතඳර සිරියා , ඇන්නෑවේ මේ මළ කෝලම් , ආලෙ බැන්ද" යන ගීත ඇතුළත් නාට්‍ය කුමක්ද?
i. මනමේ නාට්‍ය
ii. සිංහබාහු නාට්‍ය
iii. මූදු පුත්තු නාට්‍ය
iv. කාලගෝල නාට්‍ය

CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

381

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	10	විෂයය பாடம் Subject	පෙරදිග සංගීතය	පත්‍රය வினாத்தாள் Paper	II	කාලය காலம் Time	පැය 02

නම/විභාග අංකය:-.....

II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සියලුම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමිවේ.

---

1. අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමඟින් ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

i. "සරිසගරිස , රිගරිමගරි , ගමගපමග , ... ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර ලියන්න."
ii. ධ් නි් ස ර් ස , ස්වර සංගතියට අදාළ රාගය කුමක්ද?
iii. උත්තර භාරතීය රාගධාරී සංගීතයේ එන සරල ශාස්ත්‍රීය ගායනා ශෛලියක් 2ක් නම් කරන්න.
iv. ආඝාතාත්මක ගැමි ගී සඳහා ගී වර්ග 2 ක් ලියන්න. (ලකුණු 04)

- අංක (v) සිට (vi) තෙක් ප්‍රශ්නවල දී ඇති හිස්තැන් සඳහා නිවැරදි පිළිතුර ප්‍රශ්න අංකය ද සමඟ ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

v. "හෙළ ගී මග" නම් ග්‍රන්ථයෙහි කතුවරයා වන්නේ" ..... සූරීන් වන අතර "ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය" නම් ග්‍රන්ථය ..... සූරීන් විසින් රචනා කර ඇත.
vi. "පැහැ සරණිය මිණි පැමිණිය කොත් අගට" ගී පදය ..... විරිතට ගායනා කරන අතර "මන් මත් කරවන දන මුළු දෙරණා" ගී පදය ..... තිතට අනුව ගයයි.

- අංක (vii) සිට (x) තෙක් ප්‍රශ්න නාඩගම් ආභාෂයෙන් බිහි වූ දේශීය නාට්‍ය ගී ඇසුරින් නිර්මාණය වී ඇත. අදාළ නාඩගම් ගීතය සහ නාට්‍ය ගීතය නිවැරදිව ගලපා ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න. (ලකුණු 04)

නාඩගම් ගී පාදය	නව නාට්‍ය ගී පාදය
vii. ඒ බුදු බව පතමින ලොබිනේ	සේ සුරිදු බරණැස් පුර පසිඳු
viii. දුල් නිමල් සිසි සේදිසි	රැසිරු ළඳුනි ඔබ ප්‍රේමයෙනා
ix. ලෝ පසිඳු තුනු රැසිරෙව් සුරිදු	නන් සිරින් වොරැදි
x. මෙමඟින් ගිය රැසිරු ඒ තරුණා	මෑ වේ මා දුටු කොමල ලියා

CamScanner

2. පහත දැක්වෙන්නේ නිර්දේශිත රාග ආශ්‍රිත තොරතුරු ඇතුලත් අසම්පූර්ණ වගුවකි.

	රාගය	ආරෝහණ	අනුවාදී ස්වර	ජාතිය	ගායන සමය	විශේෂ ලක්ෂණ
A	.....	1.	2.	සම්පූර්ණ	4.	සර්ව කෝමළ රාගය ලෙස හඳුන්වයි.
B	.....	ස,රි,ග,ප,ධ,ස්	ස රි ප	3.	රාත්‍රී ප්‍රථම	5. .....
C	.....	ස,රි,ග,ම,ප්,ධ,නි,ස්	ස රි ම් ප ධ	සම්පූර්ණ	රාත්‍රී ප්‍රථම	එක් විකෘති ස්වරයක් පමණක් යෙදේ.

i. A,B,C අක්ෂර වලින් දැක්වෙන නිර්දේශිත රාග නම් කරන්න. (ලකුණු 03)
ii. ඉහත වගුවෙහි හිස්තැන් සඳහා අදාළ පිළිතුරු අදාළ ඉලක්කම සමඟ ලියන්න. (ලකුණු 05)
iii. A හෝ C රාග දෙකෙන් එක් රාගයකට අයත් මධ්‍යලය ගීතයක හෝ ලක්ෂණ ගීතයක ස්ථායි කොටස තාල සංකේත සහිතව ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

3. පහත දැක්වෙන්නේ නිර්දේශිත තාල දෙකකට අයත් තොරතුරු වේ.

A. මාත්‍රා විෂමව යෙදෙන අතර 6 වන මාත්‍රාව මත බලිය යෙදේ.
B. මහ තනිතිතට සමාන වන අතර 9 වන මාත්‍රාව මත බලිය යෙදේ.

i. A සහ B තාල දෙක නම් කරන්න. (ලකුණු 04)
ii. A සහ B තාල දෙකෙන් එක් තාලයක් තෝරා ගෙන තාලයේ යේකාව තාල සංඥා සහිතව සම ගුණයෙන් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)
iii ඔබ විසින් තෝරා නොගත් තාලය ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

a) එම තාලයට ගැළපෙන Time Signature ලියන්න. (ලකුණු 02)
b) එම තාලයට අදාළ දේශීය තිත, තිත් සංකේත සහිතව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 04)

4. පහත දැක්වෙන්නේ විවිධ ගී වර්ග පිළිබඳ තොරතුරු ඇතුළත් වගුවකි.

A	B	C
ඇසේ මධුර ජීවනයේ ගීතා	මී වදයකි ජීවිතේ	ශ්‍රී රාහුල හිමිගේ නාමේ
විලේ මලක් පිපිලා කදිමයි	රස ආහර කවලා	සිරි බුද්ධගයා විහාරේ
සිරි සරු සාර කෙතේ	මාගේ පැලෙ අඳුර මකන්න	මව්පියො ආදී සොඳුරු තමාගේ

i. ඉහත වගුවේ A,B,C, අක්ෂර වලින් දැක්වෙන ගී වර්ග නම් කරන්න. (ලකුණු 03)
ii.. "B" අක්ෂරයෙන් දැක්වෙන ගීත සඳහා යොදා ගත් සංගීත ශෛලියේ විශේෂ ලක්ෂණ 4ක් ලියන්න. (ලකුණු 04)
iii. "C" අක්ෂරයෙන් දැක්වෙන ගී පිළිබඳ කරුණු 4ක් සහිතව විස්තරයක් ලියන්න. (ලකුණු 04)
iv. "A" අක්ෂරයෙන් දැක්වෙන ගීත නිර්මාණය කළ සංගීතඥයා නම් කරන්න. (ලකුණු 01)

CamScanner


5. ගැමි ගී, සේ ගී, යනුවෙන් දේශීය ජන ගීතය ප්‍රධාන කොටස් දෙකකි.

i.සේ ගී සහ ගැමි ගී පිළිබඳව සංසන්දනාත්මකව කරුණු 4ක් යටතේ ලියන්න. (ලකුණු 04)
ii. පහත ගී පාද ගැමි ගී සහ සේ ගී යටතේ වර්ග කර දක්වන්න.

- තණ්ඩලේ දෙන්නා දෙපොලේ දක්කනවා
- නිරිත කොණ යුතා මල් මල් සුවඳැති
- උදයට පායන හිරු දෙවියන්ටයි
- ලකළ පුළුලුකුළැ බඳ මිණි මෙවුල්ලා
- සරණයි සරණයි බුද්ධං සරණයි
- නොමදින් විකුම් පාලා
- ඉපල් පිටින් ගහන අව්ව
- ලක්ෂ්මී බුජවාසා - සකතු ජය

iii. ආඝාතාත්මක ගී සහ අනාඝාතාත්මක ගී යනු කවරේදැයි පැහැදිලි කරන්න.
(උදාහරණ සඳහා එක් ගී වර්ගයකට එක් ගීතයක් බැගින් යොදා ගන්න.) (ලකුණු 04)

6. පහත දක්වා ඇත්තේ අපරදිග ස්වර ප්‍රස්තාරයකි.



i. ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)
ii. පෙරදිග ක්‍රමයට ස්වර ප්‍රස්තාර කරන ලද, එක් එක් විභාගයට අදාළ කෝඩ්ස් (chords) ලකුණු කරන්න. (ලකුණු 04)
iii. ප්‍රස්තාරය ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.
a) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයට සුදුසු Time Signature ලියන්න.
b) ඉහත ප්‍රස්තාරය නිර්මාණය වී ඇති scale එක නම් කරන්න.
c) ඉහත අංක 1,2,3,4, ලෙස දක්වා ඇති බටහිර ස්වර සංකේත නම් කරන්න. (ලකුණු 04)

7. පහත මාතෘකා අතරින් තුනක් පමණක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
i. තබලා මුහුණතෙහි දළ රූපසටහනක් ඇඳ කොටස් හතරක් නම් කරන්න.
ii. නාදයක සහ ශබ්දයක ඇති වෙනස කරුණු තුනක් මඟින් පැහැදිලි කරන්න.
iii. ශ්‍රී ලංකාවේ ජන ගී වර්ගීකරණය උදාහරණ සහිතව රුක් සටහනකින් පැහැදිලි කරන්න.
iv.පහත ස්වර ප්‍රස්තාරය අදාළ Repetition marks යොදා නැවත ප්‍රස්තාර කරන්න.
(ලකුණු 4x3=12)

ග ග රි ස / ග ග රි ස / ග ම ප ම / ග - - -/
රි - ග ම / ප - - - / රි - ග ම / ප - - -/
ස රි ග - / රි ග ප - / ග ප ග රි / ස - - -/
ස රි ග -/ රි ග ප - / ග ප ග රි / ස - - -/

CamScanner

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වර්ෂ අවසාන ඇගයීම - 2026

ප්‍රශ්න නිවැරැදි කිරීම (සංශෝධනය)


(1) විෂය - පෙරදිග සංගීතය - 10 ශ්‍රේණිය

I පත්‍රය - I කොටස - බහුවරණ ප්‍රශ්න අංක 4 –

මෙහි “ග ස්වර වාදී **ගි** සංවාදී” යන්න “ග ස්වර වාදී **නි** සංවාදී” ලෙස නිවැරැදි විය යුතුයි.

(2) විෂය - පෙරදිග සංගීතය - 11 ශ්‍රේණිය

II පත්‍රය - II කොටස - ප්‍රශ්න අංක 07 හි ඇති ස්වර ප්‍රස්තාරය වෙනුවට මෙහි පහත දැක්වෙන ස්වර ප්‍රස්තාරය ආදේශ කරන්න.



පෙරදිග සංගීතය - 10 ශ්‍රේණිය - අවසාන වාර පරීක්ෂණය
පිළිතුරු පත්‍රය
1 කොටස

1	i	11	iv	21	ii	31	ii / iv
2	ii	12	ii	22	ii	32	iii
3	iii	13	iv	23	ii	33	ii
4	iv	14	ii	24	iii	34	i
5	ii	15	iv	25	iv	35	
6	i	16	i	26	iii	36	ii
7	ii	17	iii	27	iv	37	ii
8	iii	18	iii	28	i	38	i
9	i	19	iv	29	ii	39	ii
10	ii	20	iv	30	iv	40	iv

(ලකුණු 1 x 40= 40)

11 කොටස - පෙරදිග සංගීතය (10 ශ්‍රේණිය)

1.

i. ම ප ම ධ ප ම
ii. භෛරවී රාගය
iii. හජන් ගායනා , ගසල් ගායනා
iv. කෙලි ගී, තුන් සරණේ ගී, ගොයම් ගී (ලකුණු 04)
v. ඩබ්. බී. මකුලොළුව මහතා - සී.ද .එස්. කුලතිලක මහතා
vi. සමුද්‍ර ගෝෂ - මහ තනි තිතට (ලකුණු 04)
vii. ඒ බුදු බව පතමින ලොබිනේ - මෑ වේ මා දුටු කොමල ලියා
viii. දුල් නිමල් සිසි සේ දිසි - නන් සිරින් වොරැදි
ix. ලෝ පසිදු තුනු රැසිරෙවි සුරිදු - සේ සුරිදු බරණැස් පුර පසිදු
x. මෙමගින් ගිය රැසිරු එ තරුණා - රැසිරු ළඳුනි ඔබ ප්‍රේමයෙනා (ලකුණු 04)
(මුළු ලකුණු 12)

2.

A. භෛරවී රාගය
B. භූපාලි රාගය
C. යමන් රාගය (ලකුණු 03)

ii. 1 ස රි ග ම ප ධ නි ස්
2 රි ග ප ධ නි
3 ඔෘඩව
4දිවා ප්‍රථම ප්‍රහරය
5 “ම” “නි” වර්ජිත ස්වර වේ. (ලකුණු 05)

iii. භෛරවී හෝ යමන් රාග දෙකින් එක් රාගයකට අදාල මධ්‍යලය හෝ ලක්ෂණ ගීතයක ස්ථායි කොටස තාල සංකේත සහිතව ගීත ස්වර ප්‍රස්තාර කිරීම (ලකුණු 04)

3.

i. A - ජප් තාලය B- ත්‍රි තාලය (ලකුණු 02)
ii. එක් තාලයක යේකාව සම ගුණයෙන් ප්‍රස්තාර කිරීම (ලකුණු 04)

Past Papers Wiki

ජප් තාලය

මාත්‍රා	1	2	3	4	5	6	7	8	9	10
යේකාව	යි	න	යි	යි	න	ති	න	යි	යි	න
තාල සංඥා	X		2			0		3		

දේශීය තිත - සුළු මැදුම් දෙතිත

1	2	1	2	3	1	2	1	2	3
දො	◌ං	ජී	◌ං	ත	ග	ත	දො	◌ං	ත
^		/			^		/		

ත්‍රි තාලය

මාත්‍රා	1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16
යේකාව	ධා	ධිං	ධිං	ධා	ධා	ධිං	ධිං	ධා	ධා	තිං	තිං	තා	තා	ධිං	ධිං	ධා
තාල සංඥා	X				2				0				3			

දේශීය තිත - මහ තනි තිත.

1	2	3	4	1	2	3	4	1	2	3	4	1	2	3	4
ත	දො	◌ං	දො	මී	ත	දො	◌ං	දො	මී	කි	ත	කි	ත	දො	◌ං
^				/				^				/			

ජප් තාලය - 5/8
ත්‍රි තාලය - 4 /4 (ලකුණු 02)
දේශීය තිත නම් නිරීම සහ ප්‍රස්තාරය (ලකුණු 04)

4.

A. ගුවන් විදුලි සරල ගී
B. කපිරිඤ්ඤා ගී
C. ග්‍රැමෆෝන් ගී (ලක්ණු 03)

ii. රිද්මය වේගවත් වීම - නර්තන ශිලී රිද්මයක් වීම.
සංගීත භාණ්ඩ ලෙස වියෝලා, බැංජෝ,ටැම්බරින්,ආදිය යොදා ගනී
සරල තනු වලින් යුක්තයි.
බොහෝ තනු ඒකාකාරී බවින් යුක්ත වීම.
6/8 රිද්මය මූලික කොට නිර්මාණය වීම.
පෘතුගීසි භාෂාවෙන් රචනා වී තිබීම. (ලකුණු 04)

iii. රාගධාරී සංගීතය පදනම් කර ගී තනු නිර්මාණය වීම.
මුලින්ම විදේශීය ගීත (ඉංග්‍රීසි) ශ්‍රවණයට ලැබීම.
දෙවනුව එවකට ජනප්‍රියව පැවති නූර්ති ගීත ශ්‍රවණයට සැළසුණි.
වාද්‍ය භාණ්ඩ ලෙස වයලීනය, සර්පිනාව, තබ්ලාව මූලිකව යොදා ගෙන ඇත.
අනුකරණාත්මක ගීත වලට පසුව ස්වතන්ත්‍ර ගීත නිර්මාණය විය. (ලකුණු 04)

iv. ආනන්ද සමරකෝන් මහතා (ලකුණු 01)

5.

ගැමි ගී	සේ ගී
භාෂාව සරලයි	භාෂාව සංකීර්ණයි
මුඛ පරම්පරා ගතව පැවත එයි	පොත් පත් වල සටහන් වී ඇත/ රචකයෙකු සිටී
නාද රටා ඒකාකාරී වේ	නාද රටා සංකීර්ණයි
ස්වර ක්ෂේත්‍රය පටුයි	නාද රටා සප්තක තුනම ඇසුරු කරයි.

(ලකුණු 04)

- තණ්ඩලේ දෙන්න දෙපොලේ දක්කනවා - ගැමි ගී
- නිරිත කොන යුතා මල් මල් සුවඳැති - ගැමි ගී
- උදයට පායන හිරු දෙවියන්ටයි - ගැමි ගී
- ලකළ පුළුලුකුළැ බඳ මිණි මෙවුල්ලා - සේ ගී

- සරණයි සරණයි බුද්ධං සරණයි - ගැමි ගී
- නොමදින් විකුම් පාලා - සේ ගී
- ඉපල් පිටින් ගහන අව්ව - ගැමි ගී
- ලක්ෂ්මී බුජවාසා - සකතු ජය - සේ ගී (ලකුණු 04)

iii. ආසාතාත්මක ගී අනාසාතාත්මක ගී විස්තරය සමග උදාහරණ දැක්වීම (ලකුණු 04)
ආසාතය (තාලය) තාබිය හැකි සේ පද සංයෝග වී ඇති ගීත ආසාතාත්මක පැදි ලෙස හාදින් වේ.සමුහ ගායනයට වඩාත් උචිත යි. උදාහරණ - ගොයම් ගී, නෙළුම් ගී, කමත් ගී

ආසාතයක් (තාලයක්) තැබිය නොහැකි සේ පද සංයෝග වූ පැදි අනාසාතාත්මක පැදි නම් වේ.ගායකයාගේ අභිමතය පරිදි අවශ්‍ය තැනක යති පිහිටා ඇද පැද ලෙලවා ගයයි. උදාහරණ- ගැල් , පැල්, පාරු, පතල් යන ගැමි ගීත.

6.

i. + + ගප පධ /ම - - - /නි - ප ධප /ග - - - / (ලකුණු 04)

ii. C / F / G / C / (ලකුණු 04)

iii.


a) 4 /4
b) C MAJOR SCALE
c) 1 minim rest
2 semi breave
3 minim
4 quaver (ලකුණු 04)

7. මාතෘකා වලින් තුනක් තෝරා ගෙන පිළිතුරු සැපයීම (ලකුණු 4 x 3 = 12)

i. තබලාවේ මුහුණත ඇද (සෘාහි, මෛදාන් /ලවය, වාන්ටි, ගජරා) යන මුහුණතෙහි කොටස් 4ක් නම් කිරීම

ii. 1මිහිරි හඬ නාදය වේ. අමිහිරි හඬ ශබ්ද වේ
2නාදය සමාකාරී කම්පන වලින් යුක්තවේ. ශබ්ද විෂමාකාරී කම්පන වලින් යුක්ත වේ.
3 නාදය නිශ්චිත සංඛ්‍යාතයක් ඇත. ශබ්ද නිශ්චිත සංඛ්‍යාතයක් නොමැත.
4 නාදය නැවත නැවත ඒ ආකාරයෙන්ම ඇති කළ හැකිය. ශබ්ද නැවත ඒ ආකාරයෙන්ම ඇති කළ නොහැකිය.

iii. ශ්‍රී ලංකාවේ ජන ගී වර්ගීකරණය



iv. ග ග රි ස / % / ග ම ප ම / ග - - - /
//රි - ග ම / ප - - - // (( )) • // • (මෙම සංකේත ද යොදා ගත හැකිය)
((ස රි ග - / රි ග ප - / ග ප ග රි / ස - - -))

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library